සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

06 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2022(2023) | **21 S**

නම: ..... | **සිංහල භාෂාව හා සාහිත්‍යය** | **කාලය පැය දෙකයි**

I කොටස

උපදෙස්

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. නූතන සිංහල අක්ෂර මාලාව ප්‍රධාන වශයෙන් කොටස්,
(1) 2 කි. (2) 4 කි. (3) 6 කි. (4) 3 කි.

02. හල් කළ නොහැකි ව්‍යඤ්ජන අක්ෂරයක් වන්නේ,
(1) ධ ය. (2) ම ය. (3) (අ)ඃ ය. (4) ව ය.

03. ප්‍රථම පුරුෂ ඒකවචන අතීත කාල ස්ත්‍රී ලිංග ක්‍රියා පදය යටින් ඉරක් අඳින්න.
(1) දිවුවෝ ය. (2) දිවුවේ ය. (3) දිවූහ. (4) දිවුවා ය.

04. අනුක්ත නාම පද පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) මම, අප, ගුරුවරු (2) ඔවුන්, තෝ, ළමයින්
(3) දැරියක, ගොවියෙකු, තොප (4) මා, හාවා, මිනිස්සු

05. මහප්‍රාණ අක්ෂරයක් රහිත පිළිතුර තෝරන්න.
(1) පීඨය (2) කඩය (3) ස්ථාන (4) සංඛ

අංක 06 හා 07 ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු වචනය තෝරන්න.

06. (1) ස්ථාවර (2) ප්‍රතීපත්තිය (3) පුෂ්ඵය (4) කුඨය

07. (1) පරීක්සනය (2) අවබෝදය (3) දක්ෂිණ (4) මහළු

අංක 08 සිට 10 තෙක් ප්‍රශ්නවල දී ඇති වාක්‍යයේ ඉරි ඇඳි පදයට සමානාර්ථවත් පදය තෝරන්න.

08. ඔහු ජයග්‍රහණයේ <u>කිරුළ</u> පැළඳ ගන්නේ ය.
(1) මාලය (2) පදක්කම (3) කුසලානය (4) ඔටුන්න

09. ළමයි <u>කැලය</u> තුළට ප්‍රවේශ වූහ.
(1) ලැහැබ (2) වනය (3) ආරාම (4) කුටිය

10. කෘෂිකර්මාන්තයට <u>ජලය</u> අත්‍යවශ්‍ය සාධකයෙකි.
(1) පොහොර (2) පස (3) උදක (4) වැව

අංක 11 හා 12 ප්‍රශ්නවල දී ඇති පදයට විරුද්ධාර්ථවත් පදය තිත් ඉර මත ලියන්න.

11. දිළිඳු - .....

12. විවිධත්වය - .....

අංක 13 හා 14 ප්‍රශ්නවලට පහත දී ඇති වාක්‍ය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු තිත් ඉරි මත ලියන්න.

දක්ෂ පොලිස් නිලධාරීහු අනතුර සිදු වූ ස්ථානයට ඉක්මණින් ළඟා වූහ.

13. ඉහත වාක්‍යයේ සඳහන් ක්‍රියා විශේෂණ පදය ලියන්න.....

14. ඉහත වාක්‍යයේ ඇති නාම විශේෂණ පදය නාම පදය සමඟම උපුටා ලියන්න. .....

අංක 15 සිට 19 තෙක් ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන පිළිතුර පහත ඇති වචනවලින් තෝරා ලියන්න.

15. තුරු පෙළ මඟ දෙපස සෙවණ .....

16. කුරුලු රංචුව ඈතට පියාසර .....

17. ..... කුඹුරට ගියාය.

18. ..... පාර පිරිසිදු කළේ ය.

19. ..... සුවඳ විහිදුවමින් පිපී වැනෙති.

(ගොවියෝ, කරයි, පුෂ්ප, කරති, ගෙවිලිය, කම්කරුවා, පුෂ්පයෝ, කළේ ය.)

20. පහත වාක්‍ය නිවැරදි ව පද බෙදා විරාම ලක්ෂණ යොදා නැවත තිත් ඉර මත ලියන්න.
තාත්තේරාමුහිසකියන්නේමොකද්දමල්ලිවිමසුවේය

.....

.....

(ල : 2x20=40)

II කොටස

• 01, 02 හා 03 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

01. පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 150කට නොඅඩු රචනාවක් ලියන්න.

(i) මාගේ ප්‍රියතම ලේඛකයා
(ii) ශ්‍රී ලංකාවේ වාරිතාක්ෂණය
(iii) රූපවාහිනිය හා ළමා පරපුර
(iv) වසංගත රෝගවලින් ආරක්ෂා වෙමු.
(v) සාරධර්ම සුරකිමු. (ල : 18)

02. පහත සඳහන් අවස්ථා දෙකින් එකකට පමණක් පිළිතුරු සපයන්න.
(i) දුර බැහැර ප්‍රදේශයක ජීවත් වන තම වැඩිමහල් සොහොයුරාගේ සුව දුක් විමසමින් තම පාසලේ පැවැත්වෙන වාර්ෂික සාහිත්‍ය උත්සවය නැරඹීමට පැමිණෙන ලෙස ඉල්ලමින් යවන ලිපිය ලියන්න.

නැතහොත්

(ii) ඔබ පාසලේ පවත්වනු ලබන වාර්ෂික සාහිත්‍ය තරගාවලියේ කෙටි කතා අංශයෙන් ප්‍රථම ස්ථානය ලබා ගත් ඔබේ හොඳම යාළුවට සුබ පතා යවන සුබ පැතුම් පත සකස් කරන්න.

(ල : 12)

03. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

රූකඩ කපන්නාගේ කම්මල වූ කලි කාමරයකින් ද ඉස්තෝප්පුවකින් ද යුතු, මැටි ගසා අතු සෙවණි කළ පැල්පතකි. කපා නිම කළ, නොකළ රූකඩින් ද, සායම් ගා වේළීමට තැබූ විචිත්‍ර වර්ණයෙන් බබළන රූකඩින් ද නියන්, කැති, පිහියා, කෙටේරි , සායම් ටින්, බුරුසු, සතුන්ගේ ඇටකටු, දත් නිය, ඔලිඳ ඇට යනාදියෙන් ද පිරි ඔහුගේ කම්මලෙහි ඇතුළු කාමරය වූ කලි නියම කටුගෙයක් විය. ඉස්තෝප්පුවේ කොනක වූ වතුර සැළියක් ගත් ලිග්ගල් තුනකින් යුතු උදුනෙන් දුම් නොනගින්නේ දවල් දොළහේ සිට එක දෙක වන තෙක් පමණි. එතැන් සිට රෑ හත වන තුරු උදුනෙන් නඟින ගින්න නොනිවේ. වතුර හැළිය උපකාර වූයේ ඔහුගේ රූකඩ කැපීමට නොව ඔහු රූකඩ කැපීමෙන් එකතු කරගත් සුළු මුදලට තවත් සත කිහිපයක් ලබා දීමෙන් ඔහුගේ ආදායම වැඩි කිරීමටය.

i. කම්මලේ අයිතිකරුවා කවුද?
ii. කම්මලේ ස්වාභාවය කෙසේ වීද?
iii. කම්මලේ ඇතුළු කාමරයේ ඇති ද්‍රව්‍ය හතරක් ලියන්න.
iv. ඇතුළු කාමරය සමාන කළේ කුමකට ද?
v. වතුර සැළිය හා ලිග්ගල් තුන තිබුණේ කොහිද? (ල : 2x5=10)

04. පහත දැක්වෙන අනාගත කාල වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.
i. මම උදෑසනින් ම පාසලට පැමිණෙමි.
ii. නුඹ පාසල් වත්ත පිරිසිදු කරහි.
iii. වෛද්‍යවරයා රෝගියා පරීක්ෂා කරයි.
iv. දැරිය මනහර නැටුමක් ඉදිරිපත් කරයි.
v. තරඟකරුවෝ ආරම්භක ස්ථානයට ළඟා වෙති. (ල : 2x5=10)

05. පහත සඳහන් ප්‍රකාශ උපුටාගත් පාඩම ප්‍රකාශ කළේ කවුද? කා හටද? යන්න ලියන්න.
i. ''ඈ අප්පේ, කාට දැකුමක් ද ඔය කඩේ ගෙනියන්නේ''
ii. ''වන මැදැ දී මම බියෙන් ගැසි ගැසි මඳ කොටැ පසු පස බැලුයෙමි.
iii. ''ගොඩින් පැන ගත්තා හුඟක් ළඟ හින්ද''
iv. ''ඔවුන් බැලීමට යාම සඳහා ඉඩ දුන මැනව''
v. ''එහෙනම් ගිහින් හොයාගෙන වරෙල්ලා'' (ල : 2x5=10)

06. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.
i. ජනශ්‍රැතියට අයත් අංග හතරක් ලියන්න.
ii. ' කුඹියා' වචනයේ යෙදී ඇති පිල්ලම් පිළිවෙළින් ලියන්න.
iii. ' අපේ ගම' කෘතිය කාගේ නිර්මාණයක් ද?
iv. කුරුණෑගල යුගයේ දී ලියැවුණු වටිනාම ග්‍රන්ථය කුමක්ද?
v. 'ළමයා පැළයක් සිටුවයි.' යන වාක්‍යයේ උක්ත පදය හා කර්ම පදය උපුටා ලියන්න.

උක්ත පදය .....

කර්ම පදය ..... (ල : 2x5=10)

07. පහත සඳහන් පද සම්පූර්ණ කරන්න.

i. නිදන්නේ ඇයි? මේ ළමයා තවත් උදේ

.....

.....

සිඹී මගේ මූණ පුරා උරා අහෝ

ii. වැස්ස වගේ ආකාසේ වහින්න මං ආසයි
වතුර වගේ වැව් විල්වල පිරෙන්න මං ආසයි

.....

.....

iii. .....

.....

කුලෙන් රජ වූවත්
එයින් ඵල කිම සිරිත් හැරියොත්

iv. ඉරු ගිලෙන දවසේ
ගහණ ද පොහෝ දවසේ

.....

.....

v. .....

.....

පුංචි පුංචි නුවණිනා
පුංචි ළමෝ පඬිවෙනා

(ල: 02x05=10)

සිංහල භාෂාව හා සාහිත්‍ය 06 ශ්‍රේණිය පිළිතුරු පත්‍රය

I කොටස

01. 1	02. 3	03. 4	04. 3	05. 2
06. 1	07. 3	08. 4	09. 2	10. 3

11. දුප්පත්/ නිර්ධන 12. ඒකියත්වය 13. ඉක්මනින් 14. දකුණ පොලිස් නිලධාරීහු
15. කරයි/ කළේ ය. 16. කරති. 17. ගෙවිලිය 18. කම්කරුවා 19. පුෂ්පයෝ
20. තාත්තේ, රා.මු.නි.ස. කියන්නේ මොකද්ද? මල්ලි විමසුවේ ය.

II කොටස

(01) කරුණු සඳහා ලකුණු 6
සංවිධානාත්මක බව ඇතුළු සමස්ත ලකුණු 8
ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 4
මුළු ලකුණු 18

(02) ආකෘතිය සඳහා - 4
අඩංගු කරුණු සඳහා - 6
ශිල්පීය දක්ෂතා - 2
මුළු ලකුණු - 12

(03) (i) රූකඩ කපන්නා
(ii) කාමරයකින් හා ඉස්තෝප්පුවකින් යුතු මැටි ගසා අතු සෙවණී කළ පැල්පතක්
(iii) කපා නිම කළ රූකඩ
කපා නිම නොකළ රූකඩ
සායම් ගා වේලීමට තිබූ රූකඩ
නියන්, කැති, පිහියා, කෙටේරි, සායම් ටින්, බුරුසු, සතුන්ගේ ඇටකටු, දත්, නිය, ඔළිඳ ඇට ආදී ද්‍රව්‍යවලින් හතරක් ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු ද, ඊට අඩුව ලියා ඇත්නම් ලියා ඇති ගණනට 1/2 බැගින් ලකුණු පිරිනමන්න.
(iv)කටු ගෙයකට/ කටු ගෙයක්
(v) ඉස්තෝප්පුවේ/ ඉස්තෝප්පුවේ කොනක (ලැ:2x5=10)

04. (i) මම උදෑසනින්ම පාසලට පැමිනුණෙමි. (ii) නුඹ පාසල් වත්ත පිරිසිදු කළෙහි.
(iii) වෛද්‍යවරයා රෝගියා පරීක්ෂා කළේ ය. (iv) දැරිය මනහර නැටුමක් ඉදිරිපත් කළා ය.
(v) තරගකරුවෝ ආරම්භක ස්ථානයට ළඟා වූවෝය/ වූහ. (ලැ:2x5=10)

05. (i) නරි නයිදේ රැවටිච්චි පාඩමේ නරියා විසින් ඉබ්බා හා මාන කොක්කු දෙදෙනාට
(ii) අලි උවදුර පාඩමේ අලියා විසින්
(iii) නලපාන ජාතකය පාඩමේ කපුරාල විසින් නරියාට (නලපාන ජාතකය පාඩමේ නම නොමැතිව නරි බැණා නාට්‍යයේ කියා දරුවා සඳහන් කොට ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න.
(iv) රාසිංදෙයියන්ට බැණ වැදුණ මුරකරුවා පාඩමේ වෙස්වලාගෙන සිටි රාජසිංහ රජතුමා මුරකරුට
(v) විචෙං චුලංගෙං යමු කිරි නැනෝ පාඩමේ පොරමොලා විසින් ගමා හා කයිරාට (ලැ:2x5=10)

06. (i) ජනකතා, ජනකවි, පිරුළු ජනනාටක උපහැරණ (ii) දිගු පාපිල්ල, ඉස්පිල්ල, ඇලපිල්ල
(iii) මාර්ටින් වික්‍රමසිංහ මහතා (iv) පන්සිය පනස් ජාතක පොත
(v) උක්ත පදය - ළමයා කර්ම පදය - පැළයක් (ලැ:2x5=10)

07. (i) නැඟි සිටින්න යැයි අත ගා කියන්නා සේ - ජනේලයෙන් දැන් හිරු ගස් ගලා වැටී
(ii) ලියැදි දිගේ එහෙන් මෙහෙන් ගලන්න මං ආසයි - ළපටි ගොයම් දළුත් එක්ක නටන්න මං ආසයි
(iii) නමින් පට බැන්දත්
රනින් රුවනින් දිලුණත්
(iv) සඳ සිකුරු දවසේ
ගොමින් පිරිබඩ ගනුව නිවසේ
(v) පුංචි ඇටේ පැළ වෙනා
පුංචි පැළේ ගස වෙනා
(එක කවි පදයක් පමණක් නිවැරදි ව ලියා ඇත්නම් එක් ලකුණක් පිරිනමන්න.) (ලැ:2x5=10)